## ඩෙල්ටා ගැලීල් චර්යාධර්ම සංග්‍රහය

අරමුණ

මෙම චර්යා ධර්ම සංග්‍රහය නිර්මාණය කර ඇත්තේ ඩෙල්ටා ගැලීල් ඉන්ඩස්ට්‍රීස් ලිමිටඩ් (“ඩෙල්ටා ගැලීල්”) සමග අනුබද්ධ සමාගම් සමග ව්‍යාපාර කිරීමේ අවම නියමයන් දැක්වීමට පිණිස වේ. ඩෙල්ටා ගැලීල් මෙම සංග්‍රහයේ දක්වා ඇති සියලු වගන්ති හා අදාළව අවදානම් ඇගයීමක් කරනු ඇති බවටත් ද්‍රව්‍ය සහ අදහස් ඩෙල්ටා ගැලීල් වෙත විකුණනු ලබන්නා වූ සැපයුම්කරුවන්ට මෙම ප්‍රතිපත්තිය ගැන දැනුම් දී, මෙහි අඩුපාඩු සහ දියුණු කළ යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීම තුළින් ක්‍රියාකාරී ලෙස අවදානම අඩු කිරීමටත් ඔවුන්ගේ දායකත්වය ලබා ගනු ඇතැයි අපේක්ෂා කරයි.

නෛතික බැඳීම

ඩෙල්ටා ගැලීල් සහ ඊට අනුබද්ධ සමාගම් විසින් ව්‍යාපාර කරනු ලබන්නේ තමා ක්‍රියාත්මක වන අධිකරණ බල සීමාවට අදාළ නීති සහ නියෝග අනුව කටයුතු කරන මෙහි “සැපයුම්කරුවන්” වශයෙන් දක්වා ඇති බලයලත් කොන්ත්‍රාත්කරුවන්, වෙළෙන්දන්, නියෝජිතයන් සමඟ පමණි. ඩෙල්ටා ගැලීල් සමාගම සිය සේවකයන් හෝ ව්‍යාපාර හවුල්කරුවන් විසින් සිදු කරන නීතියට අනුකූල වීම පැහැර හැරීම සම්බන්ධයෙන් කිසිදු සමාවක් ලබා නොදෙන අතර සිය සේවකයන් සහ ව්‍යාපාරික හවුල්කරුවන් නීති හෝ නියෝග කඩ කිරීම පිළිබඳ කඩිනමින් දැනුම් දිය යුතු බවට නියම කරයි. සියලු අවස්ථාවලදී මෙම සංග්‍රහය, අදාළ ගනුදෙනුකාර සංග්‍රහය සහ නීතිය අතර කිසියම් වෙනස්කම් පවතින විට, ඉහළ සම්මතය අදාළ වනු ඇත.

පාරදෘශ්‍යභාවය

එක්ව කටයුතු කරන සියලු කරුණුවලදී ඩෙල්ටා ගැලීල් සමාගම විසින් පූර්ණ පාරදෘශ්‍යභාවය අපේක්ෂා කරනු ලබයි. සියලුම සැපයුම්කරුවන් සිය ව්‍යාපාරික පරිචයන්හිදී සදාචාරාත්මක විය යුතුය. මෙම ප්‍රමිති සමඟ පවතින අනුකූලභාවය ප්‍රදර්ශනය කිරීමට අවශ්‍ය සියලු ලිපිලේඛන සැපයුම්කරුවන් විසින් සිය වැඩබිම් තුළ අවුරුදු 5ක කාලයක් තබා ගත යුතුය. මෙම ලේඛනවලට, ඩෙල්ටා ගැලීල් සමග ඔවුන් එකඟවන වාර්තා තබා ගැනීමේ නියමයන්ද ඇතුළත් වන නමුත් ලේඛන ඒවාට පමණක් සීමා නොවේ. මෙම ප්‍රමිතීන් සමඟ වන අනුකූලතාව අධීක්ෂණය කිරීම පිණිස, කලින් නිවේදනය කළ හෝ නොකළ නිෂ්පාදන කම්හල් වැඩබිම් පරීක්ෂාවන් වැනි සත්‍යාර්ථ ක්‍රියාමාර්ග ඩෙල්ටා සහ එහි අනුබද්ධ ආයතන විසින් අනුගමනය කරනු ඇත. සැපයුම්කරුවන් විසින් අධීක්ෂණ නැරඹුම් අවස්ථාවන්හිදී ඩෙල්ටා ගැලීල්හි නියෝජිතයින් වෙත නිෂ්පාදන වැඩබිම්වලට, සේවකයින්ගේ වාර්තා සහ වන රහස්‍ය සම්මුඛ සාකච්ඡා සඳහා සේවකයින් වෙත පූර්ණ ප්‍රවේශය ලබා දිය යුතුය. ඊට අමතරව, විගණනය තුළ විමසීම් කරනු ලබන කරුණු සම්බන්ධයෙන් ඩෙල්ටා ගැලීල්හි නියෝජිතයින් විසින් සිදු කරනු ලබන සාධාරණ විමසුම් සඳහා සැපයුම්කරුවන් වහාම පිළිතුරු සැපයිය යුතුය. සම්පූර්ණ ප්‍රවේශය ලබා දීම පැහැර හැරීම හෝ සාධාරණ විමසුම්වලට පිළිතුරු නොදීම වාරණ පැනවීමට හෝ සැපයුම්කරුවන් සමග ඇති ව්‍යාපාරය අවසන් කරනු ලැබීමට හේතු විය හැක. එසේම සිය සැපයුම් දාමයේ සියලු ස්ථරවල සිටින සිය සැපයුම්කරුවන් පිළිබඳව දැන සිටීමට ඩෙල්ටා ගැලීල් සමාගම ඇප කැප වී සිටී. තවද ඩෙල්ටා ගැලීල් සමග නිපැයුම් ව්‍යාපාර සිදු කරන සැපයුම් දාමයන් සිතියම්ගත කිරීම මගින් සැපයුම්කරුවන් මේ සඳහා තව දුරටත් කැප වනු ඇතැයි ඩෙල්ටා ගැලීල් අපේක්ෂා කරයි.

සේවා නියුක්තික සම්බන්ධතාව

සේවකයින්ට ගරු කරන නීති සහ කොන්දේසි සැපයුම්කරුවන් විසින් සම්මත කර අනුගමනය කළ යුතු අතර, අවමයක් වශයෙන්, ජාතික සහ අන්තර්ජාතික කම්කරු සහ සමාජ ආරක්ෂණ නීති සහ රෙගුලාසි යටතේ වන ඔවුන්ගේ හිමිකම් ආරක්ෂා කළ යුතුය. සියලු සේවකයන් නිවසින් පිටත් වීමට පෙර සිය මූලික සේවා නියමයන් පිළිබඳව දැනුවත් කර තිබිය යුතුය.

වෙනස් ආකාරයට නොසැලකීම

ඩෙල්ටා විසින් සංස්කෘතික වෙනස්කම් පිළිගෙන ඒවාට ගරු කරන අතර, සේවා සේවා නියුක්තිය සඳහා පදනම විය යුත්තේ හැකියාව මිස, ඔවුන්ගේ විශ්වාසයන් හෝ කිසියම් පුද්ගලික ලක්ෂණ නොවේ. ඩෙල්ටා ගැලීල් සියලු සේවකයන්ට සාධාරණ සහ සමාන ලෙස සැලකීමට තිර ලෙස කැපව සිටියි. අයදුම්කරුවන් සහ සේවකයන් ඇගයීමට ලක් කළ යුත්තේ ඔවුන්ගේ නිපුණතාව, සුදුසුකම් සහ ජයග්‍රහණ මතය. සමාජ කණ්ඩායම, ජනවාර්ගික සම්භවය, ජාතිය, ස්ත්‍රී පුරුෂභාවය, ලිංගික දිශානතිය, ආගම, ජාතිකත්වය, වයස, ආබාධිතභාවය, හෝ වෙනත් කිසියම් ලක්ෂණයක් මත පදනම්ව සේවයට බඳවා ගැනීමේදී, ගෙවීම් කිරීමේදී, උසස් කිරීමේදී, විනය කටයුතුවලදී, සේවය අවසන් කිරීමේදී හෝ විශ්‍රාම ගැන්වීමේදී වෙනස් ආකාරයට සැලකීමක් සැපයුම්කරුවන් විසින් අනුගමනය නොකළ යුතුය.

බලහත්කාර ශ්‍රමය

බන්ධනාගාර, ප්‍රතිඥාගත, බැඳුම්ගත හෝ වෙනත් ආකාරයක බලහත්කාර ශ්‍රමය ඇතුළුව කිසිදු ආකාරයක බලහත්කාර ශ්‍රමයක් සැපයුම්කරුවන් විසින් භාවිතා නොකළ යුතුය. සිය රැකියාව වෙනුවෙන් සේවකයන් විසින් ගෙවීම් කළ යුතු නැත. සේවකයන් බඳවා ගැනීම සහ ඔවුන්ගේ කටයුතු සිදු කිරීම හා අදාළ සියලු වියදම් සහ ගාස්තු සේවා යෝජකයා විසින් ගෙවිය යුතු අතර සේවකයන්ගෙන් ඒවා අය නොකළ යුතුය. සිය සංචාරක ලේඛන හා අදාළ පාලනය සේවකයන් වෙත තිබිය යුතු අතර ඔවුනට පූර්ණ වශයෙන් සංචාරය කිරීමේ නිදහස තිබිය යුතුය. බලහත්කාර ශ්‍රමය ලබා ගැනීම හා අදාළව ILO දර්ශකවල දක්වා ඇති බලහත්කාර ශ්‍රමය පිළිබඳ දර්ශක නොමැති බවට සැපයුම්කරුවන් වග බලා ගත යුතුය. වැඩිදුර විස්තර සියලු ඩෙල්ටා ගැලීල් සැපයුම්කරුවන් විසින් අවබෝධ කරගෙන අත්සන් කළ යුතු බලහත්කාර ශ්‍රමය නොගැනීමේ සහතිකයේ දක්වා ඇත. ඩෙල්ටා ගැලීල්හි බලහත්කාර ශ්‍රමය ලබා නොගැනීමේ සහතිකයේ ඇති එක් එක් සහ සියලු කරුණු මෙම සංග්‍රහයේ අන්තර්ගත කර ඇත.

ළමා ශ්‍රමය

සැපයුම්කරුවන් විසින් වයස අවුරුදු 15ට අඩු හෝ රටේ නෛතික වැඩ කරන වයසට අඩු හෝ අනිවාර්ය අධ්‍යාපනය සම්පූර්ණ කරන වයසට අඩු, යන අයවළුන් අතරින් ඉහළ වයසට වඩා අඩු පුද්ගලයෙකු සේවයේ නියුක්ත නොකළ යුතුය. වයස අවුරුදු 18ට අඩු සේවකයින් සේවයේ නියුක්ත කළ යුත්තේ බාලවයස්කාර සේවකයන් හා අදාළ දේශීය නීති රීතිවලට අනුකූලව වේ.

සංගමයේ නිදහස සහ සාමූහික කේවල් කිරීම

සිය හිමිකම් ආරක්ෂා කර ගැනීම සඳහා මැදිහත් වීමේ, බිය ගැන්වීමේ, හිංසා කිරීමේ හෝ පළිගැනීමේ භීතියකින් තොරව නිදහසේ හමු වීම, සාමූහිකව කේවල් කිරීම සඳහා වන සේවකයින්ගේ අයිතිය සැපයුම්කරුවන් විසින් පිළිගත යුතු අතර ඊට ගරු කළ යුතුය. සැපයුම්කරුවන් විසින් සංගමයේ නිදහස සහ සාමූහික කේවල් කිරීම දේශීය නීතිය යටතේ සීමා කර ඇති රටවල් සඳහාද ඒ ආකාරයටම පිළිගත යුතුය.

දුක්ගැනවිලි යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම

සේවකයන්ට කාර්යක්ෂම දුක්ගැනවිලි යාන්ත්‍රණයක් ඇති බවට සැපයුම්කරුවන් විසින් වග බලා ගත යුතු අතර ඊට විවිධ වාර්තා කිරීමේ මාධ්‍ය විය යුතු අතර අඩු වශයෙන් ඒවායින් එකක් හෝ රහස්‍ය විය යුතුය.

හිංසනය සහ අපහරණය

සමාගම තුළ සිය තනතුර කුමක් වුවත්, කිසියම් වෙනත් සේවකයෙකු, පුරුෂයෙකු හෝ කාන්තාවක විසින් සිදු කරන ලබන වාචික, මානසික සහ කායික අපහරණයන්, බියවැද්දීම්, ලිංගික අඩන්තේට්ටම්, සූරා කෑම්, පහර දීම් හෝ ගැරහීම්වලින් තොර පරිසරයක වැඩ කිරීමේ නිදහස සේවකයින්ට තිබිය යුතු අතර සැපයුම්කරුවන් විසින් සියලු සේවකයින්ට අභිමානයෙන් සහ ගෞරවයෙන් සැලකිය යුතුය.

වැඩ කරන පැය ගණන් සහ විවේක කාලයන්

සේවකයින් විසින් වැඩ කරනු ලබන පැය ගණන් ඔවුන් විසින් නිෂ්පාදන කටයුතු සිදු කරන අධිකරණ බලසීමාවල ඇති නිත්‍ය සහ අතිකාල වැඩ ගණන් ඉක්මවා නොයන බවට සැපයුම්කරුවන් විසින් වග බලා ගත යුතුය. නිත්‍ය වැඩ සතියක් පැය 48 නොඉක්මවිය යුතුය. සියලු අතිකාල වැඩ සිදු කළ යුත්තේ එකඟත්වයක් සහිතවය. සැපයුම්කරුවන් නිත්‍ය පදනමින් අතිකාල වැඩවල යෙදෙන ලෙස ඉල්ලා නොසිටිය යුතු අතර සියලු අතිකාල වැඩ සඳහා උපරිම අනුපාතයක අතිකාල මුදල් ගෙවිය යුතුය. සුවිශේෂී ව්‍යාපාරික නොවන තත්ත්වයන් යටතේ, සතියක් තුළ නිත්‍ය සහ අතිකාල වැඩ පැය ගණන් පැය 60 නොඉක්මවිය යුතුය. සෑම දින හතක කාලයක් තුළ, සෑම සේවකයෙකුටම අඩු වශයෙන් පැය 24ක අඛණ්ඩ පැය ගණනකට සමාන, විවේක දිනයක් හිමි විය යුතුය.

ගෙවීම් කටයුතු

සැපයුම්කරුවන් විසින් සිය සේවකයින්ට අඩුම වශයෙන්, නෛතික වශයෙන් අනිවාර්ය අවම ප්‍රමිතිවලට හෝ බලපවත්නා වැටුප යන දෙකෙන් වැඩි එක අනුව ගෙවීම් පැකේජ ලබා දෙමින් ඔවුනට සාධාරණ පරිදි ගෙවීම් කටයුතු සිදු කළ යුතු අතර, නීතිය හෝ කොන්ත්‍රාත්තුව අනුව අවශ්‍ය කිසියම් අතිරේක ප්‍රතිලාභ ලබා දිය යුතුය. දේශීය නීතිය අනුව අතිකාල වැඩ සඳහා පූර්ණ වශයෙන් ගෙවීම් සිදු කළ යුතු අතර, එක් එක් වැටුප් කාලසීමාව සඳහා සේවායෝජකයා විසින් පැහැදිලි, ලිඛිත ගිණුම් ප්‍රකාශයක් ලබා දිය යුතුය. ගෙවීම් කටයුතුවලින් සේවකයින්ගේ මූලික අවශ්‍යතා නොසැපිරෙන විට සහ කිසියම් අභිමතානුසාරී ආදායමක් ලබා දෙන විට, එම අවශ්‍යතා ඉටු කර ගැනීමට හැකි ගෙවීම් මට්ටමක් ධනාත්මක ලෙස තීරණය කිරීමට සැපයුම්කරුවන් විසින් උචිත ක්‍රියාමාර්ග ගත යුතුය.

සෞඛ්‍යය සහ ආරක්ෂාව

සියලු සේවකයන්ගේ ආරක්ෂාව සඳහා වන අවදානම් හඳුනා ගැනෙන, වළක්වන සහ අවම කරන ක්‍රම ක්‍රියාකාරීව ලෙස ඇති කිරීමට සැපයුම්කරුවන් වගබලා ගත යුතුය. සිය සේවා යෝජකයාගේ ආයතනය තුළ කටයුතු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස වැඩ කරන අතරතුර හෝ වැඩ කිරීම හේතුවෙන් සිය සේවකයන්හට හදිසි අනතුරු සහ සෞඛ්‍යයට සිදු විය හැකි හානි වීම් වළක්වා ගැනීම සඳහා සැලසුම් කර ඇති පිරිසිදු, ආරක්ෂාකාරී සහ සෞඛ්‍ය සම්පන්න වැඩ පරිසරයක් සැපයුම්කරුවන් විසින් ලබා දිය යුතුය. ආලෝකකරණ, උණුසුම්කරණ සහ වාතණ පද්ධති ප්‍රමාණවත් විය යුතුය. සැපයුම්කරුවන් විසින් තමන් කටයුතු කරන රටවල සහ ප්‍රජාවන්හි සේවාස්ථාවල සෞඛ්‍යය සහ ආරක්ෂාව සඳහා අදාළ සියලු, නීතියෙන් අනිවාර්ය කර ඇති ප්‍රමිතිවලට අනුකූල වීමට අවශ්‍ය වේ. සේවකයන් සඳහා නේවාසික පහසුකම් ලබා දී ඇති විටද, එම ප්‍රමිතීන් අදාළ වේ.

පරිසරය

බලශක්තිය, ජලය, අපද්‍රව්‍ය, අපජලය, වායු මුක්තක, සහ රසායන ද්‍රව්‍ය වැනි පරිසරයට සිදු වන බලපෑම් ඇති කිරීමට ඇති අවදානම් අවම කිරීමට සැපයුම්කරුවන් විසින් ඒවා කළමනාකරණය කිරීමට අඩු කිරීමට කටයුතු කළ යුතුය. සැපයුම්කරුවන් විසින් තමා කටයුතු කරන රටවල පාරිසරික ආරක්ෂාව හා අදාළ සියලු නීති සහ රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතුය. සැපයුම්කරු විසින් පරිසරය කෙරෙහි ඇති කරවන අහිතකර බලපෑම් අවම කර ගැනීමට සැපයුම්කරුවන් විසින් සාධාරණ ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය.

ආරක්ෂාව

පිටතට යැවෙන නැව්භාණ්ඩ තුළට ප්‍රකාශ නොකළ භාණ්ඩ ඇතුළු කිරීමෙන් එරෙහිව ආරක්ෂා වීම සඳහා නිසි ආරක්ෂණ ක්‍රියාමාර්ග ස්ථාපිත කර ගත යුතුය. එවැනි අයිතමවලට මත්ද්‍රව්‍ය, ජෛවවිද්‍යාකාරක, පුපුරණ ද්‍රව්‍ය, අවි ආයුධ, විකිරණශීලී ද්‍රව්‍ය, නීති විරෝධී ආගන්තුක ද්‍රව්‍ය, සහ වෙනත් තහනම් භාණ්ඩ ඇතුළත් විය හැකිය. සියලු ආනයනය කෙරෙන රටවල් සඳහා අදාළ වන අවශ අවශ්‍යතා ලෙස විදේශීය නිෂ්පාදකයින් එක්සත් ජනපද රේගු සහ දේශසීමා ආරක්ෂණ (CBP) දෙපාර්තමේන්තුවේ CTPAT මාර්ගෝපදේශ ඩෙල්ටා සමාගම විසින් පිළිගනු ලැබේ.

කාන්තා අයිතිවාසිකම්

කාන්තා සේවකයින්හට ප්‍රතිලාභ, සමාන සැලකීම, සිය වැඩවල ගුණාත්මකභාවය හා අදාළ සමාන ඇගයීම සහ පුරුෂ සේවකයින්හට විවෘත වන සියලු තනතුරු පිරවීම හා අදළ සමාන අවස්ථාද ඇතුළත් පඩිනඩි ලබා ගැනීමේ අයිතිය කාන්තාවන්ට තිබේ. ගර්භණීභාව පරීක්ෂාවන් සේවා නියුක්තියේ කොන්දේසියක් නොවිය යුතු අතර, එම පරීක්ෂණ සිදු කරන සේවකයින්ට නියම නොකළ යුතුය. මාතෘ නිවාඩු ලබා ගන්නා සේවිකාවන් (දේශීය සහ ජාතික නීති අනුව හිමිවන නිවාඩු කාලය) සේවයෙන් පහ කිරීමට යටත් නොවිය යුතු අතර සේවයෙන් පහ කිරීමේ, ජ්‍යෙෂ්ඨත්වය අඩු කිරීමේ හෝ වැටුප් අඩු කිරීමේ තර්ජනයකට යටත් නොවිය යුතු අතරම, තම පැරණි වැටුප සහ ප්‍රතිලාභ යටතේම නැවත පූර්ව සේවානියුක්තිය වෙත නැවත පැමිණීමේ හැකියාව තිබිය යුතුය. උපත් පාලනය භාවිතා කිරීමට සේවකයින්ට බල නොකළ යුතුය. සිය ප්‍රජනන සෞඛ්‍යය ඇතුළුව සෞඛ්‍ය තත්ත්වයට හානි සිදු විය හැකි ලාටු වර්ග හෝ ද්‍රාවණ වර්ගවලට සේවකයින් නිරාවරණය නොකළ යුතුය. ගර්භණීභාවය හා සම්බන්ධ යෝග්‍ය සේවා සහ කාන්තා නේවාසිකාගාර සැපයීමට සැපයුම්කරුවන් කටයුතු කළ යුතුය.

උප-කොන්ත්‍රාත්තු ලබා දීම

ඩෙල්ටා ගැලීල්හි ලිඛිත අනුමැතිය නොමැතිව ඩෙල්ටා ගැලීල් නිෂ්පාදන හෝ උපාංග නිෂ්පාදනය කිරීම සඳහා සැපයුම්කරුවන් විසින් උප කොන්ත්‍රාත්කරුවන් භාවිතා නොකළ යුතු අතර එසේ උප කොන්ත්‍රාත්කරුවන් යොදා ගත හැක්කේ ඔවුන් චර්යාධර්ම සංග්‍රහයට අනුකූලව කටයුතු කිරීමට එකඟ වී ඇති අවස්ථාවල පමණි.

මෙම ප්‍රතිපත්තිවල උල්ලංඝනය කිරීම් සඳහා යෝග්‍ය පරිදි ගනු ලබන ක්‍රියාමාර්ගවල වියදම සැපයුම්කරුවන් විසින් දැරිය යුතුය. මෙම ප්‍රමිතිවල අනාගත අනුකූලතාවය සහතික කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමේ අයිතිය ඩෙල්ටා ගැලීල් සමාගම සතු වේ. මෙම ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වීම අවසාන වශයෙන් ඩෙල්ටා ගැලීල් සහ බලයලත් සැපයුම්කරු අතර වන සම්බන්ධතාවය අවසන් කිරීමට හේතු වනු ඇත.